Alcohol and Drug Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**මාධ්‍ය නිවේදනය 02 - 2021/12/15**

**මෙවර අයවැයේ දුම්කොළ බදු වැඩිකිරීම අතිශයින්ම දුර්වල රටට අවාසිදායක බහුජාතික දුම්කොළ සමාගම් පොහොසත් කරවන දියුණු රටවල් කිසිසේත් අනුගමනය නොකරන වැරදි තීරණයකි.**

- 2022 අයවැය තුළින් සිගරට් එකක මිල රුපියල් 5කින් ඉහල දැමූ බව මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කරනු ලැබීය. එම වැඩිකිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ වැඩි වශයෙන් අලෙවිවන සිගරට් එකක මිල රුපියල් 5කින් වැඩි විය. ඉන් රජය බදු ලෙස අයකරගෙන ඇත්තේ රුපියල් 3.50 පමණි. ඉතිරි රුපියල් 1.50 බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගමට (BAT) ලෙස ප්‍රදානය කර ඇත.

- මෙලෙස සිගරට් එකකින් සමාගමට රුපියල් 1.50 ප්‍රදානය කිරීම නිසා ආසන්න වශයෙන් සිගරට් සමාගමේ ලාභය 2022 වසරේ රුපියල් බිලියන 2.4 කින් වැඩි වෙනු ඇත. ආණ්ඩුව විසින් බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගමට (BAT) අයත් බහුජාතික සමාගමට ප්‍රදානය කරනු ලැබූ බිලියන 2.4 ක රජයට බදු ලෙස අයකරගත හැකිව තිබූ ආදායමකි.

- තවද වසර 3කින් වැඩි නොවූ සිගරට් බදු වැඩිවිය යුතුව තිබුණේ රුපියල් 3.50කින් නොව අවම වශයෙන් බදු රුපියල් 10කින් හෝ ඊට වඩා වැඩි අගයකිනි. අවම වශයෙන් රුපියල් 10කින් සිගරට් බදු වැඩි වූවානම් රජයට ලබා ගත හැකිව තිබූ බදු ආදායම රුපියල් බිලියන 23කි. ලංකා දුම්කොළ සමාගම (CTC) නමින් පෙනීසිටින, කොටස් අයිතියෙන් 84% බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගමට (BAT) අයත් බහුජාතික සමාගමකි. එම නිසා රජයක් විසින් කළ යුත්තේ රටේ මුදල් පිටතට රැගෙන යන මෙවැනි සමාගම් වල භාණ්ඩවලට උපරිම බදු මුදල් පනවා රටින් පිටතට ඇදී යන ධනස්කන්ධය රට තුළ කෙසේ හෝ රඳවා ගැනීමට නිවැරදි ලෙස බදු ප්‍රතිපත්තියක් සකස් කිරීමයි. එසේ නොකොට බහුජාතික සමාගමකට වාසි ලෙස තීරණ ගැනීම අතිශයින්ම සැකයට තුඩු දෙන කරුණකි. විශේෂයෙන්ම රටට මුදල් අවශ්‍ය මොහොතක මෙවැනි තීරණ ගැනීම සැක සහිතය.

- වසර 3කින් සිගරට් බදු වැඩි වී නොමැති අවස්ථාවක දිගින් අඩු සිගරට්වල බදු ප්‍රමාණය අවසානයට තිබූ බදු ප්‍රමාණයෙන් 49%කින් මෙවර අයවැයෙන් අඩුකර ඇත. ඒ අනුව රුපියල් 20ට අලෙවි කළ සිගරට් එකක වෙළ පොලේ මිල රුපියල් 10 දක්වා අඩු වී ඇත. එමගින් පාසල් සහ කුඩා දරුවන් සිගරට්වලට යොමු වීමට ප්‍රබල ලෙස බලපානු ඇත. එමෙන්ම අඩු ආදායම්ලාභීන්ගේ දුම්වැටි භාවිතය වැඩි කිරීමට මෙය බලපානු ඇත. අඩු ආදායම්ලාභීන් සහ කුඩා දරුවන් අඩු මිල සිගරට් තුළින් ග්‍රහණය කර ගැනීම ලෝකයේම දුම්කොළ සමාගම් අනුගමනය කරන කූඨ උපායකි. පුදුම සහගත කරුණ නම් එවැනි කූඨ උපායන්ට සහයෝගය දෙන බදු ප්‍රතිපත්තියක් රට තුළ ක්‍රියාත්මක වීම පුදුමසහගත ය.

- තවමත් ශ්‍රී ලංකාව තුළ පාර්ලිමේන්තුව තුළින් අනුමත කරන ලද විධිමත් සිගරට් බදු අයකිරීමේ ක්‍රමවේදයක් නොමැත. දැනට පවතින සිගරට්ටුවේ දිග අනුව බදු අය කිරීමේ සංකීර්ණ ක්‍රමවේදය ඉවත් කර විද්‍යානුකූල සරල බදු ප්‍රතිපත්තියක් ගෙන ඒම තුළින් සිගරට් සඳහා උපරිම බදු පනවා රජයේ ලාභ උපරිම කර, සිගරට් කර්මාන්තයට අනිසි ලාභ ලබාගැනීමේ ඉඩකඩ ඇහිරිය හැක. මේ ආකාරයේ කාර්යක්ෂම ක්‍රමවේදයක් ගෙන එන බව 2021 අයවැය කතාවේ බදු ප්‍රතිපත්තිය ශීර්ෂය යටතේ එවකට මුදල් අමාත්‍ය සහ වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් සඳහන් කළ නමුත් 2022 අයවැය ඉදිරිපත් කිරීම දක්වාම අවශ්‍ය කටයුතු සිදුනොකොට මුදල් අමාත්‍යාංශය මගින් තම වගකීම හිතාමතාම පැහැර හැර ඇත.

- තවද ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) නිර්දේශයන්ට අනුව, සිගරට් හා දුම්කොළ නිෂ්පාදන සඳහා වූ බදු සැලකිය යුතු ලෙස ඉහළ දැමීම සිගරට් භාවිතය පාලනය කිරීමේ හොඳම ක්‍රමයයි. (ලෝක සෞඛ්‍ය සංවිධානය, WHO/NMH/PND/14.2) සාමාන්‍යයෙන් සිගරට් බදු 10%කින් ඉහළ නැංවීම තුළින් රජයේ බදු අදායම වැඩිකර ගන්නා අතරම අප වැනි රටවල සිගරට් භාවිතය 5%කින් අඩු වන බව ගණන් බලා ඇත. මේ මොහොතේ සිගරට් භාවිතය අවම කිරීම COVID-19 පාලන ක්‍රියාවලියට ද බෙහෙවින් උපකාරී වන බව විද්‍යාත්මකව සනාථ වී තිබේ.

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
නො. 40/18,
උද්‍යාන පාර,
කොළඹ 05.